# නර්තනය - II ශ්‍රේණිය

**(පළමු වාරය )**



The National e-learning Portal for the General Education

නිපුණතා 5.0 : ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා 5.1 : ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විග්‍රහ කරයි.

නිපුණතා 5.1.1 : වන්නම් වල පසුබිම හා විකාශනය

## වන්නම් පසුබිම

ශාන්ති කර්මවලින් බැහැර වු ශාස්ත්‍රීය නර්තන අංගයක් ලෙස වන්නම් හැඳින්විය හැකි ය. වන්නම් යන වචනය ද්‍රවිඩ භාෂාවේ එන වර්ණම් හෙවත් වර්ණනා යන වචන වලින් සිංහලයට බිඳී ආ වචනයකි. මෙහි අදහස වැනුම නොහොත් වර්ණනාවයි.

## වන්නම්වල පොදු ලක්ෂණ

- මුල් කාලයේ ගායනය සඳහා රචනා වීම
- තාල රූපයකට අනුව නිර්මාණය වී තිබීම
- අදහස් ප්‍රකාශ කිරීමෙ සිදු නොවේ. සම්ප්‍රදායන් අයත් පද කොටස් නර්තනය කිරීම.
- පසු කාලයේ දී වන්නම් නර්තනය සඳහා යොදා ගැනීම

## උඩරට වන්නම්








- මහනුවර යුගයේ රාජ සභාව ආශ්‍රිතව නිර්මාණය විය.

- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජුගේ කවිකාර මඩුවේ දී ගායනා කර ඇත.
- විනෝදාස්වාදය සඳහා රචනා වූ බව සඳහන් වේ.
- " වන්දිභට්ටයින් " නම් පිරිස විසින් ගායනා කර ඇත.
- වන්නම් සංඛ්‍යා 18 කි.

## උඩරට වන්නම් රචනා වීම පිළිබඳ මත

- රම්මොලක අධිකාරම් විසින් වන්නම් ප්‍රබන්ධ කොට ඇති බවත් මහරජතුමාගේ ගම්වර පවා ලබා ගත් බවත්,

- දකුණු ඉන්දියාවේ නාගපට්ටනම් ස්ථානයෙන් ගෙන්වා ගත් " ගණිතාලංකාර " බමුණු පඬිවරයා විසින් රචනා කරන ලද බව.

- ගණිතාලාංකාර නම් බමුණු පඬිවරයාට පඬුරු පාක්කුඩම් යවා ලංකාවට ගෙන්වා ගත් බවත් ඔහු විසින් රචිත " නෙර්ත මාලය නැමති කෘතිය ආශ්‍රයෙන් මල්වතු විහාර වාසී හිමිනමක් වන්නම් රචනා කරන ලද බව කිරි ඇල්ලේ ඥාන විමල හිමි පවසයි.

## පහතරට සින්දු වන්නම්



- පහතරට වන්නම් සිංදු වන්නම් ලෙස ද හඳුන්වයි.
- සින්දු වන්නම් සංඛ්‍යාව 32 කි.
- භක්ති කාව්‍ය ලක්ෂණ ප්‍රකාශ කරනු ලබයි.
- උපුල්වන් දෙවියන්ගේ ( විෂ්ණු ) ගුණ වර්ණනාවන් මෙයට ඇතුළත් ව ඇත.
- දඹදෙණි හා කෝට්ටේ යුගයන් අතර කාලයේ දී රචනා වී ඇති බව.
- වන්නම් 32 දම්වැලක පුරුක් මෙන් එකිනෙකට සම්බන්ධ වී තිබීම විශේෂත්වයකි.

## සින්දු වන්නම් රචනාවීම පිළිබඳ මත.

- අන්ධ බ්‍රාහ්මණයකු තමන්ට පෙනීම ලබා දෙන ලෙස ඉල්ලා උපුල්වන් දෙවියන්ට පුජෝපහාර ලෙස වන්නම් රචනා කළ බව

- සි.ද. එස්. කුලතිලක මහතා -

දහ අට වන්නම් කෘතිය

- බරණ ගණිතයා විසින් රචනා කොට නෙත් අඳ පුද්ගලයෙකුට ලබා දී ඔහු විසින් උපුල්වන් දෙවියන් ඉදිරියේ ගායනා කොටෙ ඇස් පෙනීම ඇති වු බව

## සබරගමු වන්නම්





- සබරගමු වන්නම් පිළිබඳ තොරතුරු ලබා ගත හැකි. මුලාශ්‍ර විරලය.
- පුජාර්ථයෙන් බැහැරව විනෝදාස්වාදය මුලික කරගෙන නිර්මාණය වී ඇත.
- ප්‍රභූන්ගේ නිවෙස්වල හා වලව්වල ගායනය හා නර්තනය කළ බව සඳහන් වේ.
- ප්‍රථමයෙන්ම සබරගමු මහ සමන් දේවාලයේ දෙවියන් ඉදිරියේ ඉදිරිපත් කළ බව කියැවේ.

## සබරගමු වන්නම් පිළිබඳව විවිධ මත

**1864 කලවානේ " ධර්මාලංකාර අතපත්තු මුදලි " විසින් සංස්කරණය කල කෘතියේ වන්නම් 36 ක් සඳහන් වේ.**

**1908 මහවලතැන්න බණ්ඩාර ලියන ලද ලිපියේ වන්නම් 29 ක් සඳහන් වේ.**

- 1956 කහවත්ත හිරමඩගම තියඹරා වත්තේ ඩී.ඩී. යාහින්න විසින් ලියන ලද " **නෘත්‍ය විනෝද යන්** " කෘතිය හා 1956 ඊ.ඒ. දෙල්ගොඩ විසින් රචිත සබරගමු නාට්‍ය කලාව කෘතිය සබරගමු වන්නම් පිළිබඳ වැදගත් වේ.
- දැනට ලැබී ඇති පැරණිම තොරතුරු අනුව 36 ක් ව තිබු වන්නම් අතරින් 21 ක් අද්‍යතනයේ භාවිතයේ පවති.

## කාර්ය පත්‍රිකාව

හිස්තැනට සුදුසු වචනය යොදන්න.

(01) වන්නම් ශාන්ති කර්ම වලින් බැහැර වු ................................................................ නර්තන අංගයකි.

(02) වන්නම් යනු ද්‍රවිඩ භාෂාවේ එන ...................................... හෙවත් ................................................................ යන වචනයේ සිංහල වචනයයි.

(03) වන්නම් ........................................................................ රූපයකට අනුව නිර්මාණය වී තිබේ.

(04) උඩරට වන්නම් ................................................... යුගයේ .............................................................. රජු කල රචනා වී ඇත.

(05) පහතරට වන්නම් ......................................................... වන්නම් නමින් ද හඳුන්වනු ලබයි.

පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | උඩරට | පහතරට | සබරගමු |
|---|---|---|---|
| වන්නම් සංඛ්‍යාව | | | |
| වන්නම් නිර්මාණයට තුඩු දුන් අරමුණු | | | |
| වන්නම් නිර්මාණය පිළිබඳ මත | | | |
| මුලින්ම වන්නම් ගායනා කල ස්ථානය | | | |
| වන්නමේ කොටස් | | | |

# පසුගිය වසර 05 ක අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රශ්න

## 2016

ප්‍රථමයෙන් උඩරට වන්නම් ගායනා කරන ලද්දේ ........................................................ මඩුවේ දී ය.

## 2017

වන්නම් වල පොදු ලක්ෂණ ( කෙටි සටහන් ලියන්න)

## 2018

- වන්නමක ........................................................ මඟින් පිළිඹිබු වන්නේ එහි නාද මාලාවයි.
- දකුණු ඉන්දියාවේ නාගපට්ටනමෙන් ගෙන්වා ගත් ........................................................ නම් පඬිවරයා විසින් උඩරට වන්නම් රචනා කළ බැව් කියවේ.
- සින්දු වන්නම් කෙටි සටහන් ලියන්න

## 2019

- පහතරට සින්දු වන්නමක කොටස් ගණන කීය ද ?
- කවිකාර මඩුවේ දී වන්නම් ප්‍රබන්ධ කොට රජුගෙන් ගම්වර ලබා ගත්තේ .................................... අධිකාරම් තුමාය.

## 2020

වන්නම් නර්තනයේ දී භාවිතා කරනු ලබන්නේ ........................................................ චලන වේ.